රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 16/2023

මගේ අංකය : EST-6/03/LEA/3182(3)
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2023.09.06

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## කුලවද්දාගත් දරුවෙකු හදාවඩා ගැනීම වෙනුවෙන් රාජ්‍ය නිලධරයෙකුට නිවාඩු ලබා දීම

ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 18 වගන්තිය කෙරෙහි ඔබේ අවධානය යොමු කරවමි.

02. එම පරිච්ඡේදයේ 18 වගන්තියට 18:11:4 හා 18:12 ලෙස නව උප වගන්තීන් ඇතුළත් කිරීමට 2023.06.26 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

18:11:4 රජයේ ස්ථිර නිලධරයෙකු සඳහා කුලවද්දාගත් දරුවෙකු හදාවඩා ගැනීම වෙනුවෙන් වැඩ කරන දින 03ක විශේෂ පීතෘත්ව නිවාඩුවක් ලබා ගැනීමට අදාළ නිලධරයාට හිමිකම ඇති අතර මෙම නිවාඩුව ලබා ගැනීම සඳහා කුලවද්දා ගන්නා දරුවා මාස 10කට අඩුවිය යුතු අතර දරුවා කුලවද්දාගත් දින සිට මාස 03ක් ඇතුළත එය ලබා ගත යුතු ය. අදාළ නිලධරයන් තම විවාහ සහතිකය, දරුවාගේ උප්පැන්න සහතිකය හා දරුවා කුලවද්දා ගැනීමට පවරන ලද නඩුවේ තීන්දුව ඉදිරිපත් කර, විශේෂ නිවාඩුවේ හිමිකම සනාථ කර ගත යුතු ය.

18:12 කුලවද්දාගත් දරුවෙකු හදාවඩා ගැනීම වෙනුවෙන් රජයේ ස්ථිර නිලධාරිනියකට නිවාඩු

18:12:1 දරුවෙකු හදාවඩා ගැනීම වෙනුවෙන් විශේෂ අවස්ථාවක් සේ සලකා මෙම පරිච්ඡේදයේ විධිවිධානවලට යටත්ව පහත අනුපිළිවෙලට උපරිම මාස 04ක් අඛණ්ඩව නිවාඩු ලබා දීමට පුළුවන.

18:12:1:1 සාමාන්‍ය විධිවිධාන යටතේ,

I. මෙහි 5 වගන්තිය හා 8 වගන්තිය අනුව නිවාඩු හෝ කනිෂ්ඨ / ප්‍රාථමික නිලධාරිනියක සම්බන්ධයෙන් නම් 26 වගන්තිය අනුව නිවාඩු
II. මෙහි 10 වගන්තිය අනුව ඉකුත් නිවාඩු
III. මෙහි 21 වගන්තිය අනුව අඩ වැටුප් නිවාඩු
IV. මෙහි 22 වගන්තිය අනුව වැටුප් රහිත නිවාඩු

16/2023
ඩී.ජී.දීප්ත දයානන්ද
පරිපාලන නිලධාරි
ආණ්ඩුකාර ලේකම් වෙනුවට
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
දකුණු පළාත.

18:12:1:2 ගුරුවරියක සම්බන්ධයෙන් වූ කළ,

I. මෙහි 24:3 උප වගන්තිය අනුව නිවාඩු

II. මෙහි 24:4 හා 24:5 උප වගන්ති අනුව අසනීප නිවාඩු

III. මෙහි 24:6 උප වගන්තිය අනුව වැටුප් රහිත නිවාඩු

18:12:1:3 පොලිස් සැරයන්වරියක හෝ පොලිස් කොස්තාපල්වරියක සම්බන්ධයෙන් වූ කළ,

I. මෙහි 8 වගන්තිය අනුව නිවාඩු

II. මෙහි 10 වගන්තිය අනුව ඉකුත් නිවාඩු

III. මෙහි 21 වගන්තිය අනුව අඩ වැටුප් නිවාඩු

IV. මෙහි 22 වගන්තිය අනුව වැටුප් රහිත නිවාඩු

18:12:2 ඉහත සඳහන් පරිදි නිවාඩු ඉල්ලුම් කිරීමේ දී පහත සඳහන් අවශ්‍යතාවන් හා විධිවිධානයන් සම්පූර්ණ කර ඇති බවට අදාළ නිලධාරිනිය විසින් පුද්ගලිකව තහවුරු කළ යුතු ය.

18:12:2:1 හදාවඩා ගැනීම සඳහා ලබා ගන්නා දරුවාගේ වයස මාස 10කට අඩු විය යුතු අතර, එම දරුවාගේ උප්පැන්න සහතිකයේ සත්‍ය පිටපතක් ඉදිරිපත් කළ යුතු ය.

18:12:2:2 දරුවා නීත්‍යානුකූලව ලබා ගෙන තිබීම හෝ දරුවා නීත්‍යානුකූලව ලබා ගැනීම සඳහා අධිකරණ ක්‍රියාමාර්ගයකට එළඹ ඇති බව සනාථ කළ යුතු ය.

18:12:3 මෙම නිවාඩුව, දරුවාගේ නීතිමය භාරකාරිත්වය සම්බන්ධයෙන් අධිකරණය ඉදිරියේ නඩු කටයුත්තක් ආරම්භ කරන ලද දින සිට හෝ දරුවාගේ නීත්‍යානුකූල භාරකාරීත්වය සම්බන්ධයෙන් අධිකරණයෙන් අතුරු නියෝගයක් ලබා දුන් දින සිට හෝ දරුවා කුලවද්දා ගැනීම සම්බන්ධයෙන් පවරන ලද නඩුවේ තීන්දුව ලබා දුන් දින සිට හෝ ආරම්භ කළ යුතු අතර දරුවාගේ උපතේ සිට මාස 10ක් ගත වීමට පෙර ආරම්භ විය යුතු ය. කෙසේ වුව ද, පෙර කී අවශ්‍යතා සම්පූර්ණ කරන දිනය දරුවාගේ උපතේ සිට මාස 10කට පසුව එළඹෙන දිනයක් වුවහොත් මෙම විධිවිධාන අනුව නිවාඩු ලබා ගැනීමට හිමිකමක් නැත.

18:12:4 වැටුප් රහිත නිවාඩු ලබා ගැනීමට පෙර නිලධාරිනිය විසින් ලබා ගෙන ඇති ණය හෝ අත්තිකාරමක, මාසික වාරික නොකඩවා ගෙවීම සඳහා සතුටුදායක වැඩ පිළිවෙලක් යෙදීමට නිලධාරිනිය වගබලා ගත යුතු අතර, එය නිසි පරිදි සිදුවන බවට දෙපාර්තමේන්තු ප්‍රධානියා තහවුරු කර ගත යුතු ය.

18:12:5 යම් හෙයකින් නිවාඩු අනුමත කිරීමෙන් පසු දරුවා මිය ගියහොත් එයින් දින 07කට පසු මෙම නිවාඩුව අවලංගු වේ.

මෙම රාජ්‍ය පරිපාලන/ රාජ්‍ය ..... 16/2023 ...... /
..... දින සිට
ගරු අ ..... 2023 . 07 . 21 .....
දින ලබා දී
ආණ්ඩුකාර ලේකම් / ..... / ..... 
ඩී.පී.දීප්ත දයානන්ද
පරිපාලන නිලධාරි
ආණ්ඩුකාර ලේකම් වෙනුවට
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
දකුණු පළාත.

18:12:6 මේ යටතේ ලබා දෙන අඩ වැටුප් සහිත හෝ වැටුප් රහිත නිවාඩු, වැටුප් වර්ධක කාර්යයන් සඳහා ද විශ්‍රාම වැටුප් කාර්යයන් සඳහා ද බාධාවක් නොවිය යුතු ය. එම කාලය තුළ ඇතිවන පුරප්පාඩුවල දී ද, උසස්වීම් ලබා දීම සඳහා ද එම නිවාඩු කාලය සක්‍රිය සේවා කාලයක් සේ සැලකිය යුතු ය.

18:12:7 මෙම විශේෂ නිවාඩුව දිය යුත්තේ හදාවඩා ගන්නා දරුවා රැකබලා ගැනීම වෙනුවෙන් පමණි.

03. මෙම චක්‍රලේඛ විධිවිධාන 2023.06.26 දින සිට ක්‍රියාත්මක වේ.


කේ.ඩී.එන්. රංජිත් අශෝක
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

දුරකථන : 0112-699399
ෆැක්ස් : 0112-692158
විද්‍යුත් ලිපිනය : ade-vi@pubad.gov.lk